රුමේනියානු ලේඛක ඉයෝන් ක්‍රියාන්ගෙ

නරිරාල වලස් අප්පු රැවටූ හැටි

රුසියන් භාෂාවෙන් සිංහල භාෂාවට නැඟුවේ

රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

රුමේනියානු ලේඛක

ඉයෝන් ක්‍රියාන්ගෙ

නරිරාල වලස් අප්පු රැවටූ හැටි

රුසියන් භාෂාවෙන් සිංහල භාෂාවට නැගුවේ

රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

කුරුලු පොත්

594/1, නාවල පාර, රාජගිරිය

දු.ක. 2863350/071-8263828

නරිරාල වලස් අප්පුව රැවටූ හැටි

රුසියන් භාෂාවෙන් සිංහල භාෂාවට නැගුවේ
රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

පළමු මුද්‍රණය - 2024

ISBN 978-624-5924-07-3

ඇතුළත සිතුවම් නිර්මාණය
බොරිස් ඉවානවිච් බ්‍රින්සේයි

පරිගණක සැලසුම්කරණය
තිළිණි ග්‍රැෆික්ස්
නො. 805/5A, විහාර මාවත,
තේවත්ත පාර, රාගම
☎0772876280

මුද්‍රණය
මධූ ප්‍රින්ටින් වර්ක්ස්
108/2, නව නුවර පාර, උඩුපිල,
දෙල්ගොඩ

ප්‍රකාශනය හා බෙදාහැරීම

කුරුළු පොත්
නො. 594/5
නාවල පාර, රාජගිරිය
☎0112863350/0718263828

එකෝමත් එක කාලෙක නරියෙක් හිටියා. හැම නරියෙක්ම වගේ මේ නරියත් හරිම කපටියි. දවසක් රෑ එළිවෙන තුරුම කන්න මොනවා හරි සොයාගන්න කියලා ඇවිද්දත් උෆට කිසිම දෙයක් සොයාගන්න ලැබුණේ නෑ. එළිය වැටුණට පස්සෙ පාරක් අයිනට ආපු මේ නරිරාල පඳුරක් යට ඇලවුණා. එහෙම ඉඳගෙන

උෆ කල්පනා කළේ කෑමට යමක් ඩැහැගන්න නම් මොන වගේ දෙයක් කරන්න ඕනෑදැයි කියලා.

ඉස්සරහ ගාත් දෙක උඩ හොම්බ තියාගෙන ඇලවෙලා හිටපු නරිරාලට එක පාරටම මාළු සුවඳක් දැනුණා. ඒ වෙලාවේ යන්තම් ඔළුව උස්සලා නරිරාල පාර දිහා බැලුවා, පාර දිගේ ගොන් බානක් කරත්තයක් ඇදගෙන එනවා උෆ දැක්කා.

"පංකාදුයි" නරිරාල කල්පනා කළා. "හොය හොයා ඇවිද්ද කෑම වේල මෙන්න ළඟටම එනවා."

නරිරාල හීන් සැරේ පඳුරෙන් එළියට ඇවිල්ලා හරියට මැරිච්ච එකෙක් වගේ පාරේ දිගැදුණා.

කරත්තෙ ටිකෙන් ටික නරිරාල ඉන්න තැනට ළං වුණා. කරත්තේ දක්කාගෙන ආපු ගොවිරාල නරියාව දැක්කා. හැබෑවටම නරියා මැරිලය කියලා හිතපු ගොවිරාල, "හෝව්, හෝව්" කියලා හරකුන්ට කෑ ගහලා කරත්තය නවත්වා ගත්තා. ගොන් බාන නතර වුණා.



ගොවිරාල නරියා
ළඟට ආවා. ඌ දිහා
බැලුවම ගොවියට
තේරුණා නරියා හුස්ම
ගන්නේ නැති බව. ගොවියා
මෙහෙම කිව්වා:

"මොන යකෙක්
ගහල ද පාරේ මැද්දෙම
මේ නරියගෙ පණ ගියේ?
හපොයි...! ඒ වුණත්
මේකගේ හම අරගෙන
අපේ හාමිනේට අගේ ඇති
කබායක් මහලා දෙන්ට
පුළුවනි නෙවැ."



එහෙම හිතලා නරියාගේ බෙල්ලෙන් අල්ලලා කරත්තයට ඇදලා දාගෙන, අමාරුවෙන් උස්සලා මාළු ගොඩට අතෑරියා. ඉන් පස්සේ ගොනුන්ට මෙහෙම කෑ ගෑවා:

"ජහ්, හඳයා, මහ්, දුඹුරා"

ගොන්නු කරත්තය ඇදගෙන ගියා.

ගොවිරාල ගොන්නු ළඟින්මයි ඇවිදගෙන ගියේ. මොකද උන්ට කෑ මොර දීලා ඉක්මනින් ගෙදරට යන්න උනන්දු කරවන්න පුළුවන් නිසා. ගිහින් විගහින් නරියාගේ හම ගලවා ගන්න.

වී වුණත් කරත්තය ගමනට පිටත් වූ ගමන්ම නරිරාල කළේ මාළුන් එක එකා අරගෙන කරත්තයෙන් බිමට දාන එකයි. ගොවියා කෑ ගාමින් කරත්තය දැක්කුවා. කරත්තය "කිරි-කිරි" ගගා ඉදිරියට ඇදුණා. මාළු එක එක කරත්තයෙන් පාරට වැටුණා.

මේ හොර නරිරාල ඇති තරමට මාළු පාරට ඇදලා දාගත්තට පස්සේ කරත්තෙන් බිමට පැනලා හණි හණිකට මාළු එකතු කරන්න පටන් ගත්තා. මාළු ඔක්කෝම එක ගොඩකට එකතු කරගෙන තමන්ගේ ගුහාවට අරගෙන ගිය නරිරාල මාළු එක එකා අරගෙන ගිල දාන්න පටන් ගත්තා. මොකද ඌ වී තරමටම බඩගින්නෙයි හිටියේ.



හැබැයි නරිරාල උදේ කෑම
ගන්න පටන් ගත්තා විතරයි
එතැනට ආවා වලස් අප්පු.

"දුකට සැපට ඉන්න මගේ යාළුවා. අනේ, මාළු ටික උඹේ අගෙයි නොවැ.
ඉතින් මටත් රහ බලන්න දියන්කො. ඒ තරමටම බඩගින්නක් තියෙන්නෙ."

"අනේ මගේ යාළුවේ. යාන්තම් පණකෙන්ද රැකගන්නය කියලා බොහොම මහන්සියෙන් තමයි මුන් ටික අල්ලා ගත්තේ. දැනට පිනට දෙන්නය කියලා මෙතැන ඒ හැටියට යමක් නැහැ නෙවැ. උඹට මාළු රහබලන්න ඔය හැටිම ආසාවක් තියේ නම් අන්න අර වැවට ගොහින් වල්ගය ඔබාගෙන හිටින්කො. එතකොට උඹට හිතේ හැටියට කන්න මාළු අල්ලා ගන්න පුළුවන් වේවි."

"අනේ යාළු, උඹ බොහොම කරුණාවන්ත හිතක් තියෙන කෙනෙක් බව මං දන්නවා. ඒ වුණත් මාළු අල්ලා ගන්නේ කොහොමද කියලා මං හාන්කවිසියක් දන්නේ නැහැ නොවැ."

"අනේ යාළු, ඕනෑම කෙනෙකුගේ බඩගින්න ඒ ඇත්තට හැම දෙයක්ම උගන්වනවායි කියලා කියමනක් තියෙනවා අහලා නැද්ද හැබෑට? මේ අහපන්, යාළු. මාළුවෙකුගේ රස බලන්න ඕනෑම නම්, හැන්දෑ කොරේ කැලෙන් එහා පැත්තේ තියෙන වැව ළඟට ගොහින් හීන් සීරුවේ වලිගය දාපන් වතුරට. හෙල්ලෙන්නෙ පෙරළෙන්නෙ නැතුව ඔහොමම වාඩි වෙලා පහුවදා එළිවෙනතුරු හිටපන්. ඉර යාන්තම් මතු වේගෙන එන්න පටන් ගන්න කොටම එක සැරේට වැරෙන් වලිගය ඇදලා අරගෙන ගොඩට වරෙන්. මං මේ ඇද ගත්ත මාළු ටික වගේ නොවෙයි, ඒ වගේ දෙගුණයක්, බාග වේලාවට තුන් ගුණයක් ලොකු මාළු උඹට ගොඩ දාගන්න පුළුවන් වෙයි."



ආයේ වචනයක්වත් කතා කරන්න කාලය නාස්ති නොකළ වලස් අප්පු කැලයට එපිටින් තිබුණු වැව ළඟට හණි හණිකට දුවගෙන ගියා. ගිහින් වලිගය වතුරට දැම්මා...

එදා රෑ කොයිතරම් හීතල සුළඟක් හැමුවා ද කීවොත් දිව උඩුතල්ලට ඇලිලා ගල් වුණා. ගිනි ගොඩක් ගහලා තිබුණත් ඒ යට තිබුණු උණු අලු තැවරුණු බිම පවා ගල් ගැහිලා වේළුණා. වැවේ වතුර මිදිලා ගල් වුණා. වලස් අප්පුගේ වලිගය මේ හීතලට කොහොම අහු වුණා ද කීවොත් හතර වටින් වලිගයට මකුණෝ විදින්නා වාගෙයි ඌට දැනුණේ. මේ වේදනාවත් හීතලත් දරාගෙන වලස් අප්පු ඉවසාගෙන හිටියා, හිටියා. ඉඳලා බැරිම තැන මුළු වැර යොදලා වලිගය

ඇදලා ගත්තා. ඒකෙන් වුණේ මේ අහිංසක වලස් අප්පුට මාළු අල්ලා ගන්න බැරි වුණ එක විතරක් නොවෙයි, වලිගයත් නැති වුණ එකයි.

ඒ කේන්තියට වලස් අප්පු මහා හඬින් කෑ ගහන්න පටන් ගත්තා. වේදනාවෙන් උඩ පැන්නා. නරියාල තමන් රැවටූ බව දැන ගත් වලස් අප්පු ඌ ගැන කොයි

තරම් කේන්තියක් ඇති කර ගත්තා ද කීවොත් මැරෙන තුරුම ඌට තඩිබාන්න හිතා ගත්තා.

ඒ වුණත් වලහාගේ කේන්තියෙන් තමන් ගැලවෙන්නේ කොහොමද කියන කාරණය මේ කපටි නරියාල හොඳින්ම දැන හිටියා. තමන්ගේ ගුහාවෙන් එළියට ආපු නරියා ඒ අසල තිබුණු ගහකට නැගගෙන ඒකේ බෙනයක් ඇතුළට රිංගා ගත්තා. වලිගය නැති වලහාව ඈත තියා දැක්කා විතරයි, නරි නයිදේ වලහාට කෑ ගහන්න පටන් ගත්තා.

"චී්යි, යාළු! එක්කෝ උඹේ වලිගෙ මාළු කාලා. එහෙමත් නැත්නම් වැවේ ඉන්න ඔක්කොම මාළු ටික අල්ලා ගන්න තරම් උඹට තණ්හාවක් ඇති වෙලා. වෙන දෙයක් නම් වෙන්න බැහැ."

රැවැට්ටුවා මදිවාට තමන්ව විහිළුවට ලක් කරන බව තේරුණු වලස් අප්පුගේ කේන්තිය තවත් වැඩි වුණා. ඌ ගහ ළඟට දුවගෙන ගියා. මේ ගස් බෙනය ඇතුළට යන්න තිබුණු ඉඩ කොයිතරම් කුඩා ද කීවොත් කොහොමටවත්ම වලහාට ඒක ඇතුළට යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ.

ඒ වෙලාවේ වලස් අප්පුට කරුවක් තියෙන අත්තක් හම්බ වුණා. ඒක බෙනය ඇතුළට දාලා කරකවන්න පටන් ගත්තේ නරිරාලව බෙනයෙන් එළියට ඇදලා අරගෙන හොඳටම ගහන්න හිතාගෙනයි...

ඒත් ලී කරුව නරි නරිරාලගේ කකුලේ පැටලුණු ගමන් නරිරාල මෙහෙම කෑ ගහනවා.

"ඇදපන්, බූරුවෝ, පුළුවන් හයියෙන් ඇදපන්! ඔය ගහට කරුව දාලා නොවැ අදින්නේ."

ලී කරුව ගහට පැටලුණු ගමන් නරිරාල මෙන්න මෙහෙමයි කෑ ගහන්නේ:

"අයියෝ, යාළු, අනේ අදින්න නම් එපා. කකුල කැඩිලා යයි."

වලස් අප්පු නරිරාලව අල්ලා ගන්න ඒ විදිහට හෙම්බත් වෙන තුරුම දැඟලුවත් ඒ උත්සාහය වතුරේ ගියා. මොනවා කළත් ඒ නරිරාලව බෙනයෙන් එළියට ඇදලා ගන්න වලස් අප්පුට පුළුවන් වුණේ නැහැ.

නරිරාලගේ රැවටිල්ලට ඇන්දුණු වලස් අප්පුට අන්තිමට වුණේ ඔන්න ඕකයි.

රුමේනියානු ලේඛක ඉයෝන් ක්‍රියාන්ගෙ

නරිරාල වලස් අප්පු රැවටූ හැටි

රුසියන් භාෂාවෙන් සිංහල භාෂාවට නැඟුවේ

රන්ජන දේවමිත්‍ර සේනාසිංහ

කුරුලු පොත් ප්‍රකාශකයෝ

594/1, නාවල පාර, රාජගිරිය දුරකථනය : 011-2863350/0718263282

Cover Design by H. Pradeep Darshana, Ragama. Tel : 0772876280

ISBN 978-624-5924-07-3

මිල රු. 350/=